# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2009 අංක 16 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 මාර්තු මස 31 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 අප්‍රේල් මස 03 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 4.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

## 2009 අංක 16 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 මාර්තු මස 31 වන දින]

එල්.ඩී.—ඕ. 51/2008.

**2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 2009 අංක 16 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— 2006 අංක 13 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියට ඇති අතුරු විධානය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් :—

"එසේ වුවද, යම් තැනැත්තකුගෙන් හෝ හවුල් ව්‍යාපාරයකින් අය කරනු ලබන සේවා ගාස්තුව, කිසිම අවස්ථාවක —

(i) 2009 මාර්තු 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් අදාළ කාර්තුවක් සඳහා රුපියල් මිලියන පහළොවක් නොඉක්මවිය යුතු ය. තව ද ;

(ii) 2009 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් අදාළ කාර්තුවක් සඳහා රුපියල් මිලියන තිහක් නොඉක්මවිය යුතු ය."

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියෙහි :—

(අ) එම උපවගන්තියේ (අ) ඡේදයට ඇති අතුරු විධානය ඉවත් කිරීමෙන්;

(ආ) එම උපවගන්තියේ (ආ) ඡේදයේ (අ) උපඡේදයේ (ii) වන අයිතමයේ "ප්‍රාග්ධන වත්කමක්" යන වචන වෙනුවට "ප්‍රාග්ධන වත්කමක්" යන වචන ආදේශ කිරීමෙන්;

2-PL 003776—3,500 (2009/03)

(ඇ) එම උපවගන්තියේ (ආ) ඡේදයේ (අ) උපඡේදයේ (iii) වන අයිතමයට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන් :—

“(iv) (2008 ඔක්තෝබර් මස 21 වන දින සිට බලපවත්වන පරිදි) ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් නිකුත් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්වලින් යුත් සෛවරී බැඳුම්කර යම් වාණිජ බැංකුවකට හෝ යම් අනේවාසික තැනැත්තෙකුට විකිණීමෙන් ලැබෙන මුදල් ;

(v) (2008 ජුනි මස 1 වන දින සිට බලපවත්වන පරිදි) භාණ්ඩාගාර බිල්පත් බැඳුම්කර ආයෝජන බාහිර රුපියල් ගිණුමෙන් ලබාගන්නා ලද අරමුදල්වලින් මිලදී ගන්නා ලද ;

(අ) (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද යම් භාණ්ඩාගාර බිල්පත් ; හෝ

(ආ) (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද යම් භාණ්ඩාගාර බැඳුම්කර,

විකිණීමෙන් උපචිත ලැබීම් ;

(vi) 2009 ජනවාරි මස 1 වන දින සිට බලපැවැත්වෙන එහෙත් 2009 දෙසැම්බර් මස 31 වන දින හෝ ඊට පෙර දිනයක නොවන්නා වූ යම් ද්‍රව්‍ය හෝ භාණ්ඩ අපනයනයෙන් වන ලැබීම් ;

(vii) 2009 දෙසැම්බර් මස 31 වන දින හෝ ඊට පෙර දිනයක නොවන්නා වූ, එහෙත් 2009 ජනවාරි මස 1 වන දින සිට හෝ ඉන්පසුව බලපැවැත්වෙන පරිදි යම් අපනයනකරුවකු විසින් අපනයනය සඳහා තවදුරටත් සකස් කිරීමක් හෝ නිෂ්පාදනය කිරීමක් සිදු නොකර

යම් අයිතමයක් හෝ භාණ්ඩයක් නිෂ්පාදනය කරන්නකු විසින් යම් අපනයනකරුවකුට අපනයනය සඳහා කරනු ලබන සැපයුම්වලින් උපචිත වන ලැබීම් ;

(viii) 2005 අංක 38 දරන සංචාරක පනතින් ස්ථාපිත ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරනු ලැබූ, යම් —

(අ) සංචාරක හෝටලයක;
(ආ) දේශීය සංචාරක ක්‍රියාකරුවකුගේ ; හෝ
(ඇ) දේශීය සංචාරක නියෝජිතයකුගේ

ක්‍රියාකාරකම්වලින්, 2009 ජනවාරි 1 වන දිනට පසුව එහෙත් 2009 දෙසැම්බර් මස 31 වන දිනයට පෙර අවස්ථාවෝචිත පරිදි, එකී හෝටලයේ ක්‍රියාකරුවා හෝ නියෝජිතයාගේ ලැබීම් ; සහ" ; සහ

(ඇ) එම උපවගන්තියේ (ආ) ඡේදයට ඇති අතුරු විධානයේ (අ) ඡේදයේ "ඒ බැංකුවේ පිරිවැටුමේ කොටසක් වශයෙන් සලකනු ලැබිය යුතු ය ; තව ද" යන වචන වෙනුවට "එම බැංකුවේ පිරිවැටුමේ කොටසක් වශයෙන් සලකනු ලැබිය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ;

මෙම ඡේදයේ කාර්යය සඳහා "බැංකුව" යන්නට මුල්‍ය ආයතනයක් හෝ උකස් තැරැව්කරුවකු ද ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

"මුල්‍ය ආයතනය" යන්නෙන්, මුදල් භාර ගැනීම තමන් වෙනුවෙන්ම කරනු ලැබුව ද නැතහොත් වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් කරනු ලැබුව ද තැන්පතු හෝ ණය පත්‍ර බැඳුම්කර ආකාරයෙන් හෝ වෙනත් යම් ආකාරයෙන් වූ ණය මගින් සහ ඒ මත පොලිය ගෙවීමේ ව්‍යාපාරය හෝ ඒ ව්‍යාපාරයේ කොටසක් සමන්විත වන සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාගත කරනු නොලැබූ යම් තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ අදහස් වේ; සහ".

බලාත්මක වන දිනය.

3. මේ පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් සහ (2) වන උපවගන්තියේ (අ) සහ (ඇ) ඡේද මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට කරන ලද සංශෝධන 2009 අප්‍රේල් මස 1 වන දින සිට බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.